(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(8).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2019 පෙබරවාරි 08 වැනි සිකුරාදා

## 2019 පෙබරවාරි 20 වැනි බදාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජූලි 11 දිනැති අංක 2079/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය (අංක 1),— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ඔක්තෝබර් 01 දිනැති අංක 2091/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය (අංක 2),— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 දෙසැම්බර් 31 දිනැති අංක 2104/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 1),— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2019.02.06 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 ජූලි 10 දිනැති අංක 2079/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 2),— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2019.02.06 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 ඔක්තෝබර් 08 දිනැති අංක 2092/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 3),— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2019.02.06 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 නොවැම්බර් 15 දිනැති අංක 2097/36 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ඔක්තෝබර් 17 දිනැති අංක 2093/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2019 මාර්තු 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

11/’18

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) LED බල්බ මිලියන 10ක් විදුලි පාරිභෝගිකයන් අතර බෙදා දීමට කටයුතු කරන ලද්දේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය සඳහා වැයවූ මුදල කොපමණද;

(iii) එකී ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල විදුලි පාරිභෝගිකයන්ගෙන් ආපසු අයකර ගැනීමට කටයුතු කිරීම අසාධාරණ බව පිළිගන්නේද;

(iv) ඉහත ව්‍යාපෘතිය මෙහෙයවන ලද ආයතනය කවරේද;

(v) එම ව්‍යාපෘතිය අසාර්ථක වූ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

72/’18

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 මැයි මුල් කාල සීමාවේදී ආරම්භ වූ වසංගත උණ රෝගී තත්ත්වය ඇති වීමට හේතු කවරේද;

(ii) එම වසංගත රෝගී තත්ත්වයට ලක් වූ බවට වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් රෝගී දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම රෝගී තත්ත්වය මත මියගිය මුළු සංඛ්‍යාව කොපමණද;

(v) මියගිය දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම රෝගයේ විශේෂ ලක්ෂණ කවරේද;

(ii) ඒ සඳහා ප්‍රමාණවත් ඖෂධ රෝහල් සතුව පැවතියේද;

(iii) රෝගය පාලනය කිරීම සඳහා රජය ගත් පියවර සඳහන් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

112/’18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් අංක SIN/B/AG/KI/2017/02 හා 2017.04.20 දිනැති විමර්ශන වාර්තාවක් ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති අතර එම වාර්තාවේ ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පාසල් බෑග් ලබාදීම සම්බන්ධව අනාවරණය කර ඇති ඡේද අංක 4 (ආ) (i) සිට (vii) දක්වා කරුණු ඉදිරිපත් කරන්නේද;

(ii) එම අනාවරණයන්ට අදාළව (ආ) (i) සිට (v) දක්වා සිදු කර ඇති නිරීක්ෂණ ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

194/’18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013, 2014, 2016 සහ 2017 වර්ෂවලදී ජනාධිපතිවරයා විසින් සිදුකළ විදෙස් සංචාර සහ එම සංචාරවල අරමුණු;

(ii) එම එක් එක් සංචාරය සඳහා සහභාගී වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ තනතුරු;

(iii) එම එක් එක් සංචාරය සඳහා වියදම් කළ මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

228/’18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රයිතලාවෙල සිට පූජාගොඩ දක්වා දිවෙන මාර්ගයක් තිබෙන බව දන්නේද;

(ii) මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා 2010 වර්ෂයේ සිට මේ දක්වා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) මෙතෙක් මෙම මාර්ගය කාපට් කර නොමැති බව දන්නේද;

(iv) එසේ නම්, මෙම මාර්ගය කඩිනමින් කාපට් කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

252/’18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

327/’18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමටගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ කිහිපයක සිට පලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, ප්‍රාදේශීය ලේකම් තනතුර පුරප්පාඩු වී පවතින බවත්;

(ii) කැකිරාව ප්‍රාදේශීය ලේකම්වරයා පලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රාජකාරි ද ආවරණය කිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකේම ජනතාව තම සේවාවන් ඉටුකර ගැනීමේදී අපහසුතාවයන්ට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ප්‍රාදේශීය ලේකම් තනතුරෙහි පුරප්පාඩුව පුරවා ජනතාවගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා කටයුතු කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

355/'18

ගරු මුහම්මදු නසීර් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "විශ්‍රාම වැටුප් සහිත සේවාවල වසර 10කට වඩා අඩු සේවා කාලයක් ඇති, එහෙත් අනියම් හා තාවකාලික සේවා කාලයක්ද සමඟ වසර 10කට වඩා වැඩි සේවයක් ඇති කම්කරුවන්ට විශ්‍රාම වැටුප් හිමිකම පිරිනැමීම" යන මැයෙන් වූ අංක 94/550/018 හා 1994.05.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි එවකට වසා දමන ලද පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ලේවැල්ල බලවේග පෙහෙකම්හලේ, තලාතුඔය මධ්‍යස්ථානයේ වැද්දුම්කරු තනතුරේ සේවය කළ දන්තුරේ, සියඹලාගොඩ, කොබෝඅංග, අංක 1/බී, දරන ස්ථානයේ පදිංචි එම්. ජී. ආර්. සමරසිංහ මහතාට මෙතෙක් විශ්‍රාම වැටුප් පිරිනැමීම සිදුවී නොමැති බව දන්නේද;

(ii) 1975.10.20 දින සිට අදාළ ආයතනය වසා දැමීමේ කාලය දක්වා සේවයේ යෙදී සිටි ඔහුට අනියම් හා තාවකාලික සේවා කාලය ද සැලකිල්ලට ගෙන විශ්‍රාම වැටුප් ගෙවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

358/'18

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි 08 වැනි දින වනවිට ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB) විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) ගෙවීමට හිඟව තිබූ මුදල කොපමණද;

(ii) එම හිඟ මුදලෙන් 2015, 2016 සහ 2017 වර්ෂවලදී පියවන ලද මුදල කොපමණද;

(iii) 2015 ජනවාරි 08 වැනි දින වනවිට ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට (ETF) ගෙවීමට නියමිත ව තිබූ හිඟ මුදල කොපමණද;

(iv) එම හිඟ මුදලෙන් 2015, 2016, 2017 යන වර්ෂවලදී පියවන ලද මුදල කොපමණද;

(v) 2015 ජනවාරි 08 වැනි දින වනවිට ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ විසින් ගෙවිය යුතුව තිබූ පාරිතෝෂික දීමනා (Gratuity) හිඟ මුදල කොපමණද;

(vi) එම හිඟ මුදලෙන් 2015, 2016, 2017 යන වර්ෂවලදී පියවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

399/'18

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 සිට 2017 දක්වා,

(i) මහවැලි 'එච්' කලාපයට වාරි ජලය ලැබෙන මහවැලියේ ඉහළ ජලාශ අවට ප්‍රදේශවලට ලැබුණු වර්ෂාපතනය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) ජල හිඟය හේතුවෙන් වගා කිරීමට නොහැකි වූ ගොවීන්ට සහන ලබා දුන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සහනය ලබාදුන් ආකාරය කවරේද;

(ii) නැවත වගා කටයුතු ආරම්භකර අස්වැන්න ලැබෙනතුරු මෙම සහන ක්‍රමය ක්‍රියාත්මක වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

405/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 අප්‍රේල් මාසයේදී කොහුවල නගරයේ ස.තො.ස. ශාඛාවක් විවෘත කළ බවත්; එයට අමාත්‍යවරයාද සහභාගී වූ බවත් පිළිගන්නේද;

(ii) එම ස.තො.ස. ශාඛාව විසින් නිකුත් කරන ලද සියලුම රිසිට්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් මුද්‍රණය කරන ලද බව දන්නේද;

(iii) එයට අමතරව මෙම ශාඛාවේ පරිගණක කටයුතු සඳහා උපදේශකවරයෙකු වශයෙන් බඳවාගෙන ඇත්තේ ඉන්දියානු සම්භවයක් ඇති බ්‍රිතාන්‍ය ජාතිකයෙකු බව පිළිගන්නේද;

(iv) මේ සඳහා විශේෂඥ දැනුම ඇති ශ්‍රී ලාංකිකයන් අවශ්‍ය තරම් සිටියදී, විදේශිකයෙකු බඳවාගැනීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් මුද්‍රණය කරනු ලබන රිසිට්පත් භාෂාත්‍රයෙන් මුද්‍රණය කිරීමටත්, පරිගණක කටයුතු සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීමටත් අවශ්‍ය පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

415/'19

ගරු නිහාල් ගලප්පත්ති මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රේගු දෙපාර්තමේන්තුව තුළ නිෂ්පාදන බදු පරීක්ෂක ශ්‍රේණියේ තනතුරු ඇති කර නොමැති බව පිළිගන්නේද;

(ii) 2000.03.27 දිනැති නිෂ්පාදන බදු අංශයට අන්තර්ග්‍රහණය කළ ලිපිය රේගු අධ්‍යක්ෂ (පාලන) විසින් අත්සන් කර ඇත්තේ රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන්ද; නොඑසේ නම්, නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන්ද;

(iii) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පමණක් නිෂ්පාදන බදු පනත යටතේ පැවරූ බලය නිසි ලෙස ක්‍රියාත්මක නොවන බව 2016.03.23 දිනැති රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝග අංක 10න් අවධානයට ලක් කරන තත්ත්වයක් තුළ මෙම පනත යටතේ ක්‍රියා කිරීමට බලයක් නොමැති රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සුරාබදු දෙපාර්තමේන්තුව යටතේ ඇති කළ තනතුරකට අයත් වැටුපක් දෝෂ සහිතව දක්වා ලිපියක් නිකුත් කිරීමට අධිකාරී බලයක් නොමැති බව පිළිගන්නේද;

(iv) එහි, එම තනතුරෙහි වැටුප් පරිමාණය රු.50,520/-7x1320 -10x1560=75,360/- ලෙස සඳහන් කළද ඒ වනවිටත් චක්‍රලේඛ 2/97 iii අනුව තනතුරේ වැටුප් පරිමාණය වූ 85,440/- 5 x2460=97,740/- හි වාර්ෂික වැටුප රු. 95,280/- ක වැටුපක් ගෙවා ඇති බව පිළිගන්නේද;

(v) එසේ නම්, එය නිවැරදි කිරීමට ගනු ලබන කඩිනම් ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

419/'19

ගරු ගාමිණී ලොකුගේ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගනු ලැබූ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පන්නිපිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ජින්සරහේන වත්ත නමැති ඉඩමේ හා කොට්ටාව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කුලහේනවත්ත නමැති ඉඩමේ වපසරිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම්වල පර්චසයක තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට මෙම ඉඩම් නිවාස ඉදිකිරීම් සඳහා පෞද්ගලික සමාගමකට හෝ ආයතනයකට විකුණා තිබේද;

(iv) එසේ නම්, එම ඉඩම්වල පර්චසයක විකුණුම් මිල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මෙම ඉඩම් පෞද්ගලික අංශයට විකිණීමේදී වෙළෙඳපොළ වටිනාකම පිළිබඳව සැලකිලිමත් වී තිබේද;

(vi) මෙම ඉඩම්වල ඉදිකරනු ලබන නිවාස විකුණනු ලබන මිල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

457/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති මුස්ලිම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම දිස්ත්‍රික්කයේ දැනට සිටින මෞලවි ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෞලවි ගුරු හිඟය පියවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

484/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කය තුළ ඇති සීමාසහිත ලංකා සතොස ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශාඛාවල ලිපිනයන් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එම සතොස ශාඛාවල සේවය සඳහා බඳවාගත් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු නාම කවරේද;

(iv) එම බඳවා ගැනීම් සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(v) මහනුවර දිස්ත්‍රික්කයේ ලංකා සතොස ශාඛා ජාලය පුළුල් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 මාර්තු 07 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

12/'18

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රත්නපුර දිස්ත්‍රික්කයේ වාර්තා වී ඇති ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) දිස්ත්‍රික්කය පුරා ඩෙංගු අවදානමක් පවතින බව දන්නේද;

(iii) එම තත්ත්වය පාලනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

73/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර ඓතිහාසික ජය ශ්‍රී මහා බෝධිය නොරොච්චෝල තාප බලාගාරයෙන් පිටවන අළුවල බලපෑමට ලක්ව තිබේද;

(ii) එසේ නම්, එමඟින් ජය ශ්‍රී මහා බෝධියට සිදු විය හැකි බලපෑම් පිළිබඳ පරික්ෂණ සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම වාර්තාව සභාගත කරන්නේද;

(iv) මේ වනවිට අවදානමක් නොමැති වුවද, ඉදිරියේ දී අවදානම් සහිත තත්ත්වයක් පැන නැඟීමේ හැකියාවක් පවතීද;

(v) මෙවැනි තත්ත්වයක් ඇති වුවහොත් ඒ සඳහා ගනු ලබන පියවර සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

124/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහනේ මූලික අරමුණු කවරේද;

(ii) ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන ක්ෂේත්‍ර කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, මෙම ජීවනෝපාය සංවර්ධන වැඩසටහනින් ප්‍රතිලාභ ලැබූ පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉදිරියේදී මෙම වැඩසටහන තවදුරටත් ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

195/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශයන්හි මේ වනවිට සිටින ශ්‍රී ලංකා දූත මණ්ඩල නියෝජිතයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අය අතර ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන හෝ ද්විත්ව පුරවැසිභාවය සහිත හෝ පුද්ගලයන් සිටින්නේද;

(iii) එසේ නම්, ඔවුන් පුරවැසිභාවය ලබා ඇති රට සහ ඔවුන් මේ වනවිට සේවය කරනු ලබන රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

231/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදිපොළ, බෝමේරුව නමින් වත්තක් තිබෙන බවත්;

(ii) එහි ලයින් කාමරවල ජීවත් වන ජනතාවට යටිතල පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වත්තේ ජීවත් වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල්වලට අවශ්‍ය පහසුකම් ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

253/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මාතර දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

328/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි තඹුත්තේගම රෝහලේ වෛද්‍යවරු ඇතුලු අනෙකුත් කාර්ය මණ්ඩලවල පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින බවත්;

(ii) මේ සම්බන්ධයෙන් 2017.09.27 වැනි බදාදා "ලංකාදීප" පුවත්පතේ "රජරට අතිරේකයේ" ප්‍රවෘත්තියක් පළකර තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ප්‍රවෘත්තියේ සඳහන් අඩුපාඩු සපුරාලීමට යම්කිසි ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, මෙම අඩුපාඩු සපුරා ජනතාවට ඵලදායී සේවාවක් ලබාදීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

356/'18

ගරු මුහම්මදු නසීර් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 වර්ෂයේදී යුධමය තත්ත්වය අවසන් වීමෙන් පසුව, උතුරු පළාතේ නැවත පදිංචි වූ සිංහල, දෙමළ සහ මුස්ලිම් තැනැත්තන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

359/'18

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි 08 වැනි දින වනවිට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (SLPC) විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) ගෙවීමට හිඟව තිබූ මුදල කොපමණද;

(ii) එම හිඟ මුදලෙන් 2015, 2016 සහ 2017 වර්ෂවලදී පියවන ලද මුදල කොපමණද;

(iii) 2015 ජනවාරි 08 වැනි දින වනවිට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට (ETF) ගෙවීමට නියමිතව තිබූ හිඟ මුදල කොපමණද;

(iv) එම හිඟ මුදලෙන් 2015, 2016, 2017 යන වර්ෂවලදී පියවන ලද මුදල කොපමණද;

(v) 2015 ජනවාරි 08 වැනි දින වනවිට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ගෙවිය යුතුව තිබූ පාරිතෝෂික දීමනා (Gratuity) හිඟ මුදල කොපමණද;

(vi) එම හිඟ මුදලෙන් 2015, 2016, 2017 යන වර්ෂවලදී පියවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

406/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැල්ලම්පිටිය, අවිස්සාවේල්ල පාර, අංක 137 දරන ලිපිනයේ පදිංචි කේ. ඩී. ප්‍රේමසිරි මහතාට මාර්ග සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීමේදී සිදු වූ අසාධාරණයක් වෙනුවෙන් ඔහු විසින් එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ අභියාචනය භාර නොගෙන ආපසු හරවා එවා ඇති බව දන්නේද;

(ii) සිදු වූ යම් අසාධාරණයක් පිළිබඳව යම් පුද්ගලයෙකු අභියාචනයක් ඉදිරිපත් කළවිට, එය භාරගැනීම සාමාන්‍ය සම්ප්‍රදාය වුවද, එය ප්‍රතික්ෂේප කර ආපසු එවීම රාජ්‍ය සේවකයෙකු විසින් නොකළ යුත්තක් බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම අභියාචනය භාරගෙන ඒ සඳහා සාධාරණ ක්‍රියාමාර්ගයක් ගෙන ඒ පිළිබඳව අභියාචනාකරුට දැනුම් දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

458/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන, පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි රෝහල්, මධ්‍යම බෙහෙත්ශාලා සහ ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ස්ථානවල නම් කවරේද;

(iii) ඉහත එක් එක් සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවක පුරප්පාඩු පවතීද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(vi) එම සෞඛ්‍ය මධ්‍යස්ථාන දියුණු කිරීමට සහ සේවක පුරප්පාඩු පිරවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

485/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම එක් එක් ඩිපෝවෙන් දැනට ධාවනය කරනු ලබන බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම ඩිපෝ අතරින් ලාභ හා පාඩු ලබන ඩිපෝ වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම එක් එක් ඩිපෝවේ පවතින පුරප්පාඩු කවරේද;

(vi) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, මේ දක්වා ඩිපෝවල ලබා දී ඇති රැකියා සංඛ්‍යාව සහ එම රැකියා ලැබූ පුද්ගලයන්ගේ නම් කවරේද;

(vii) මහනුවර දිස්ත්‍රික්කයේ ලංගම ඩිපෝවල බස් ඇණිය වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

509/'19

ගරු විමලවීර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට ප්‍රධාන පෙළේ පාසල් අතර වාර්ෂිකව පැවැත්වෙන ක්‍රිකට් හා වෙනත් ක්‍රීඩා තරඟවලදී බියර් සහ මත්වතුර නිපදවන සමාගම් මඟින් බියර් පානය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියා කරන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, පාසල් දරුවන්ට එයින් සිදු වන හානිය වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

522/'19

ගරු විදුර වික්‍රමනායක මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ මැතිවරණ කොට්ඨාසයේ කිරි ගොවීන් විසින් සපයනු ලබන දියර කිරි සඳහා මිල්කෝ ආයතනය විසින් සෑම මාසයකම 01 දින සිට 15 දින දක්වා දිනයන් සඳහා ඊළඟ දින 06 තුළදීද, 16 වන දින සිට අවසාන දිනය දක්වා වූ දිනයන් සඳහා ඊළඟ මාසයේ මුල් දින 06 තුළදීද මුදල් ගෙවීම සිදු කළ බවත්;

(ii) නමුත්, පසුගිය මාස කිහිපයක සිට ගෙවීම් ප්‍රමාද වූ අතර 2018.05.01 සිට 2018.05.15 දින දක්වා කාලයට මැයි 31 දක්වාම ගෙවීම් කර නොමැති බවත්;

(iii) මෙම තත්ත්වය හේතුවෙන් කිරි ගොවීන්ට දෙනුන්ට අවශ්‍ය ආහාර සැපයීම, දෙනුන් මිලදී ගැනීමට ලබාගත් ණය මුදල්වල වාරික ගෙවීම සහ තම එදිනෙදා වියදම් සිදුකිරීමට හැකියාවක් ලැබී නොමැති බවත්;

(iv) කිරි නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් රටේ නිෂ්පාදනයටද බලපෑම් එල්ල වීමෙන් ගැටලු සහගත තත්ත්වයක් මතුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම තත්ත්වය කිරි ගොවීන්ගේ ජීවිතවලට මෙන්ම, දේශීය කිරි නිෂ්පාදන ක්‍රියාවලිය අඩපන වීමට ද ප්‍රබල හේතුවක් විය හැකි බැවින්, පෙර පරිදි ක්‍රමානුකූලව ගෙවීම් සිදු කිරීම සඳහා පියවර ගන්නේ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

523/'19

ගරු මයන්ත දිසානායක මහතා,— ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ අභිලාශයෙන් පිහිටුවන ලද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුළින් අපේක්ෂිත අරමුණු කොතෙක් දුරට ඉටුවී තිබේද;

(ii) සමෘද්ධි ප්‍රතිලාභ වෙනුවෙන් වාර්ෂිකව වැයවන මුදල කොපමණද;

(iii) මේ වනවිට සමෘද්ධි ප්‍රතිලාභ නොලබන එහෙත් එම ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය කාලයේදී සමෘද්ධි ප්‍රතිලාභීන් අපක්ෂපාතීව තෝරා ගන්නා ලද බවට සෑහීමකට පත්වන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා අනුගමනය කරනු ලබන නව ක්‍රමවේදය කවරේද;

(iii) සමෘද්ධි සංවර්ධන නිලධාරින් හා ප්‍රතිලාභීන් දේශපාලන අරමුණු සඳහා යොදාගත් බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඉදිරියේදී එබඳු ක්‍රියාවන් වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) සමෘද්ධි අරමුදල මෑතකදී සම්මත කරන ලද ජාතික විගණන පනතට අනුව විගණනයට භාජනය කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 මාර්තු 08 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

13/'18

ගරු හේෂා විතානගේ මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පැල්මඩුල්ල මැතිවරණ කොට්ඨාසයේ, දොඹගස්වත්ත නමැති දුෂ්කර ගම්මානයේ දැඩි පානීය ජල ගැටලුවක් තිබෙන බව දන්නේද;

(ii) එම ජනතාවට පානීය ජලය ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

74/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 නොවැම්බර් මස දිනයක ක්වාලාලාම්පූර් බලා විදේශගතවීමට සිටි මැලේසියානු ව්‍යාපාරික ජයසුධීර් ජයරාම් ඇතුලු තිදෙනෙක් මෙරටින් මුදල් අපහරණය කිරීම මත ශ්‍රී ලංකා රේගුව විසින් අත්අඩංගුවට ගනු ලැබුවේද;

(ii) එසේ නම්, ඔවුන් අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේ ඔවුන් සන්තකයේ තිබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) ඔවුන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අත්අඩංගුවට ගත් පුද්ගලයන් අදාළ පරීක්ෂණ අවසන් වීමට පෙර ක්වාලාලාම්පූර් බලා යෑමට නිදහස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද;

(iii) ඒ සඳහා වූ පරීක්ෂණ එම පුද්ගලයන් නොමැතිව සිදු කර තිබේද;

(iv) මේ වනවිට අදාළ ලිපිගොනු මුදල් අමාත්‍යාංශය සතුව පවතීද;

(v) අත්අඩංගුවට ගත් මුදල් නැවතත් එම පුද්ගලයන් වෙත මුදා හැර තිබේද;

(vi) නොඑසේ නම්, මේ වනවිට එම මුදල් තැන්පත් කර ඇති ආයතනය කවරේද;

(vii) මෙම පරීක්ෂණය සඳහා දායක වූ රේගු නිලධාරින්ට ත්‍යාග මුදල් ලබා දී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

125/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි වැඩසටහන යටතේ "සමෘද්ධි සිප්දොර" ශිෂ්‍යත්ව නමින් වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම වැඩසටහනේ අරමුණු කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා "සමෘද්ධි සිප්දොර" ශිෂ්‍යත්ව ලැබූ බදුල්ල දිස්ත්‍රික්කයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නම්, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉදිරියේදී දැනට වඩා වැඩිපුර සිප්දොර ශිෂ්‍යත්ව ප්‍රමාණයක් බදුල්ල දිස්ත්‍රික්කයට ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

196/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.09 දින සිට 2018.06.30 දින දක්වා අග්‍රාමාත්‍යවරයා විසින් සිදුකළ විදේශ සංචාර;

(ii) එම සංචාරවල අරමුණු;

(iii) එම එක් එක් සංචාරය සඳහා සහභාගි වූ පුද්ගලයන් සංඛ්‍යාව හා ඔවුන්ගේ තනතුරු;

(iv) එම එක් එක් සංචාරය සඳහා වියදම් කළ මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

254/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

329/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන අලි තර්ජනය හේතුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ ගොවිතැන්වලට, නිවාසවලට හා ජීවිතවලට හානි පැමිණෙන බවත්;

(ii) ඒ සඳහා විසඳුම් ලබාදෙන මෙන් වනජීවී නිලධාරීන් දැනුවත් කළද, මෙතෙක් ස්ථිර විසඳුමක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් මේ වනවිට යම් පියවරක් ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, අදාළ නිලධාරීන් දැනුවත්කර, මෙම දිස්ත්‍රික්කයේ ජනතාවට වන අලින්ගෙන් සිදුවන හානි සම්බන්ධයෙන් විසඳුම් ලබා දෙන දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

459/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී විසුරුවා හරින ලද වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පැවති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පාලනය වූ ආයතන සඳහා බඳවාගනු ලැබූ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) බඳවා ගනු ලැබූ සේවකයන්ගේ නම් හා බඳවාගත් තනතුරු වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(v) එසේ සේවකයන් බඳවා ගැනීමට පළාත් සභාව අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

486/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කය තුළ ඇති ක්‍රීඩාපිටි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ක්‍රීඩාපිටිවල නම් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ක්‍රීඩාපිටි අතරින් සංවර්ධනය කරනු ලැබූ ක්‍රීඩාපිටි සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) එම ක්‍රීඩාපිටි සංවර්ධනය සඳහා වැය කරනු ලැබූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් ලබාගත් පුද්ගලයන්ගේ හා ආයතනවල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(vi) මහනුවර දිස්ත්‍රික්කයේ සෙසු ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

512/'19

ගරු විමලවීර දිසානායක මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර නගරයේ පිහිටි මෙතෝදිස්ත දේවස්ථානය ස්ථාපිත කර වසර හැත්තෑවක් වන බවත්;

(ii) ආගමික සිද්ධස්ථානයක් ලෙස එම සිද්ධස්ථානය පිහිටි ඉඩම සඳහා නීත්‍යානුකූල ලියවිල්ලක් මෙතෙක් ලබා දී නොමැති බවත්;

(iii) 2009 වර්ෂයේ සිට එම දේවස්ථානය සඳහා දීර්ඝ කාලීන බදුකරයක් ඉල්ලා අවශ්‍ය ලේඛන සකස් කර ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බවත්;

(iv) එම ඉල්ලීම පිළිබඳව සියලු ලේඛන අම්පාර නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලයට යවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඒ අනුව, දහස් ගණන් ජනතාවගේ ආගමික වත්පිළිවෙත් සිදු කෙරෙන මෙම දේවස්ථානයට දිගුකාලීන ඉඩම් බලපත්‍රයක් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

524/'19

ගරු මයන්ත දිසානායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් මහජනතාවගේ අවශ්‍යතා සඳහා රජයේ කාර්යාල තුළදී නිලධාරින් හමුවීම සඳහා සතිපතා නිශ්චිත කාර්යාල දිනයක් හඳුන්වා දී තිබේද;

(ii) මෙම කාර්යාල දිනය සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කර තිබේ නම්, එය කවරේද;

(iii) කාර්යාල දිනයක් ප්‍රකාශ කර තිබේ නම්, එම දිනයේදී කාර්ය මණ්ඩල රැස්වීම් හා වෙනත් රැස්වීම් පැවැත්වීමෙන් මහජනතාවට මුහුණදීමට සිදුවන අපහසුතා සම්බන්ධයෙන් පිළියම් යොදා තිබේද;

(iv) නිශ්චිත කාර්යාල දිනයන්හි දී ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාලවල උසස් නිලධාරින් කොළඹ ප්‍රධාන කාර්යාලවලට කැඳවනු ලබන්නේද;

(v) එසේ නම්, එවැනි දිනවල දී මහජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සැලසුම් කවරේද;

(vi) මහජනතාව වෙනුවෙන් වඩාත් ඵලදායී රාජ්‍ය සේවාවක් ඉටු කිරීම සඳහා නව සැලසුම් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

528/'19

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය හා විදේශීය අධ්‍යාපන කටයුතු සඳහා ශ්‍රී ලාංකිකයන්ට ජනාධිපති අරමුදල මඟින් පූර්ණ හෝ අර්ධ ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ අනුව ඒ සඳහා සුදුස්සන් තෝරා ගනු ලබන පදනම හා ක්‍රමවේදය කවරේද;

(iii) අ.පො.ස. (උසස් පෙළ) ඉහළම ලකුණු ලබාගන්නා ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ලබාදීමේ ක්‍රමවේදයක් තිබේද;

(iv) පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා උපාධිධාරින්ට ශිෂ්‍යත්ව ලබාදීමේ ක්‍රමවේදයක් තිබේද;

(v) ඉහත (iii) සහ (iv) හැර වෙනත් දේශීය හෝ විදේශීය ශිෂ්‍යත්ව ලබාදීමේ ක්‍රමවේදයක් තිබේද;

(vi) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(vii) වර්ෂ 2005 සිට 2017 දක්වා ඉහත (iii) සහ (iv) හි සඳහන් ක්‍රමවේදවලට පරිබාහිරව, දේශීය හෝ විදේශීය ශිෂ්‍යත්ව ලබාගත් පුද්ගලයන්ගේ නම්, මුදල, ආයතන හා විදේශ රටක් නම්, එම රටෙහි නම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

546/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, අර්ධද්වීප කලාපයේ, එලුවයිතිවු නමැති දූපතෙහි පිහිටි පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දූපතෙහි පිහිටි සරවනබවා විද්‍යාලෙහි අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටීමට සූදානම් ශිෂ්‍යයන් එම විද්‍යාලේ වාර විභාග සඳහා පෙනී සිටින අවසන් ශ්‍රේණිය කවරේද;

(iii) දැනට එම ශිෂ්‍යයන් අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටිනු ලබන විද්‍යාල කවරේද;

(iv) අ.පො.ස. (සා.පෙළ) විභාගය එලුවයිතිවුහි පැවැත්වීමට ඇති බාධක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

560/'19

ගරු අ. අරවින්ද් කුමාර් මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරීන් වර්ෂ 2010 සිට මේ දක්වා කාලය තුළ රාජකාරි අවශ්‍යතා සඳහා සහ ලෝක බැංකු ආධාර ඇතුළු දේශීය හා විදේශීය ආයෝජන යටතේ වූ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් විදේශගත වූ අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියාගේ නම, තනතුර, සංචාරය කරන ලද රට, සංචාරයේ අරමුණ, සංචාරයේ කාල සීමාව, සංචාරය සඳහා මුළු වියදම, (ගුවන් ටිකට් පත් ගාස්තු, යැපුම් දීමනා හා වෙනත් දීමනා) සහ ඒ සඳහා අරමුදල් සැපයූ දේශීය හෝ විදේශීය ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

562/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ ඇති ජලාශ හා වැව් අතරින් යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව අද දක්වා මිරිදිය මසුන් මුදා හරින ලද ජලාශ හා වැව් කවරේද;

(ii) එම පළාතට පසුගියදා දැඩි ලෙස බලපෑ නියං තත්ත්වය හා ගංවතුර තත්ත්වය හේතුවෙන් මිරිදිය ධීවර කර්මාන්තය දැඩි පසුබෑමකට ලක් වී ඇති බව දන්නේද;

(iii) වයඹ පළාතේ මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

581/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 174 යෝජනාවට අනුව, ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන යටතේ අමතර වැඩසටහන් සඳහා වෙන්කළ රුපියල් මිලියන 2000ක ප්‍රතිපාදන 2016 වර්ෂය තුළදී වැයකළ ආකාරය පැහැදිලි කරන්නේද;

(ii) උක්ත යෝජනාව අනුව මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් "අමතර වැඩසටහන්" කවරේද;

(iii) මෙම අමතර වැඩසටහන් සඳහා වගකීම දරන ලද ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී,

(i) පාරිසරික සමතුලිත බව ආරක්ෂා කිරීම;

(ii) තිරසර ඉඩම් කළමනාකරණය;

(iii) ජීව සම්පත් සංරක්ෂණය;

(iv) පරිසර දූෂණය පාලනය;

(v) වන සම්පත ආරක්ෂා කිරීම;

සඳහා වැය කර ලද මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2019 මාර්තු 09 වැනි සෙනසුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

14/'18

ගරු හේෂා විතානගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොඩකවෙල නගර ක්‍රීඩාංගණය අයත් රාජ්‍ය ආයතනය කවරේද;

(ii) එම ක්‍රීඩාංගණයේ විශාලත්වය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩාංගණය විවිධ ක්‍රීඩා තරඟ, පළාත්/ ජාතික මට්ටමින් පැවැත්වීම සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණයකින් යුතු බවත්;

(ii) ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ සහ රක්වාන මැතිවරණ කොට්ඨාසය තුළ ඇති මීටර් 400 ධාවන පථයක් සකස් කළ හැකි එකම ක්‍රීඩාංගණය බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම සඳහා අදාළ ඇස්තමේන්තු හා සැලැස්ම සමඟින් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත යොමු කළද මෙතෙක් අදාළ ප්‍රතිපාදන වෙන් කර නොමැති බව පිළිගන්නේද;

(ii) මෙම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

75/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා,

(i) ශ්‍රී ලංකන් ගුවන් සමාගම හරහා ආගමනය හා විගමනය කළ පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) පියාසර කළ වාර සංඛ්‍යාව;

(iii) එම ගුවන් සමාගම උපයන ලද ආදායම;

(iv) ලබන ලද ලාභය හෝ පාඩුව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 වර්ෂයේ සිට මේ දක්වා අලාභයක් සිදුවූයේ නම්, එම අලාභවලට හේතු එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

126/'18

ගරු වජිරින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පාලනය යටතේ ධාවනය වන බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එහි දැනට සේවයේ නියුතු නිලධාරින්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව, මේ දක්වා එම අධිකාරියේ ලබාදී ඇති රැකියා සංඛ්‍යාව හා එම රැකියාලාභින්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව ලබාදී ඇති බස්රථ අවසර පත්‍ර (Permits) හා එම අවසර පත් ලබාදුන් මාර්ග හා පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඒ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

238/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ දිනවල මාතලේ දිස්ත්‍රික්කයේ ගව කුර රෝගය බහුල ලෙස ව්‍යාප්ත වෙමින් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය පාලනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

255/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

330/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලාවැව සිට අනුරාධපුර තිසාවැව දක්වා ජලය ලබාදෙන කලාවැව, පරණ යෝධ ඇල, ජපන් ජබර වැනි ජලජ පැළෑටිවලින් වැසී ඇති බැවින් ජලය අපතේ යන බවත්;

(ii) ගොවිතැන් කටයුතු සඳහා ජලය ලබාදීමේදී මෙම ජලජ පැළෑටි නිසා ජලය ගලා යාමේ ප්‍රමාදයක් පවතින බවත්;

(iii) අදාළ බලධාරීන් දැනුවත් කළද මෙතෙක් විසඳුමක් නොලැබුනු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහ කන්නයේ ගොවිතැන් සඳහා ජලය මුදා හැරීමට පෙර මෙම ජලජ පැළෑටි ඉවත් කිරීමට සැලැස්මක් සකස්කර තිබේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

407/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුදැනුම මත අම්බලන්ගොඩ ධම්ම කුසල විදුහලේ තිබූ රුපියල් කෝටියක පමණ වටිනා නවීනතම ගොඩනැගිල්ලක් අනවසරයෙන් කඩා ඉවත් කර ඇති බව දන්නේද;

(ii) එම සිද්ධිය වසන් කිරීම සඳහා එවකට එම විදුහලේ වැඩ බලන ලද විදුහල්පති, සේවයෙන් පහකර ඇති බව පිළිගන්නේද;

(iii) සේවයෙන් පහකිරීම සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කරන මෙන් ඉල්ලීමක් කර ඇතත්, මෙතෙක් එවැනි පරීක්ෂණයක් සිදු කර නොමැති බව දන්නේද;

(iv) එසේ සේවයෙන් පහකිරීමට විරුද්ධව හා නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා අදාළ විදුහල්පතිවරයා විසින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති පැමිණිල්ල පිළිබඳව සොයා බලා ඔහු නැවත සේවයේ පිහිටුවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

513/'19

ගරු විමලවීර දිසානායක මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ කංසා වැවීම සඳහා රජය තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම තීරණය ගැනීමට හේතු වූ පදනම කවරේද;

(iii) කංසා මත්ද්‍රව්‍යයක් බව පිළිගන්නේද;

(iv) කංසා භාවිතය හේතුවෙන් ශාරීරික හා මානසික සෞඛ්‍ය පිරිහෙන බව පිළිගන්නේද;

(v) දැනට කංසා වැවීම සඳහා නීත්‍යානුකූලව අවසර ලබාගත් පුද්ගලයන් හා ආයතන තිබේද;

(vi) එසේ නම්, නීත්‍යානුකූලව කංසා වගා කර ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

514/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ සුරාබදු ආදායම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) 2016 වර්ෂයේ දුම්කොළ හා සිගරට් නිෂ්පාදනය මත පනවන ලද බදු මඟින් උපයාගත් ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) පසුගිය වර්ෂයට සාපේක්ෂව, ඉහත (i) සහ (ii) හි ආදායම පිළිවෙලින් රුපියල් මිලියන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2016 වර්ෂයේ මෝල්ට් මධ්‍යසාර නිෂ්පාදනය ලීටර් කොපමණද;

(ii) 2016 වර්ෂය සඳහා මත්පැන් නිෂ්පාදනය අලුතින් ආරම්භ කිරීමට සමාගම්වලට නව බලපත්‍ර නිකුත් කර තිබේද;

(iii) එසේ නම්, එම බලපත්‍ර සංඛ්‍යාව සහ එම සමාගම්වල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සුරාබදු නීතිය යටතේ වැටලීම් සිදු කිරීමට බලය ඇති ආයතනය හා එහි අධිකාරි බලය ඇත්තේ කා හටද;

(ii) අත්අඩංගුවට පත් නීත්‍යානුකූල නොවන සුරා සම්බන්ධයෙන් නීති කටයුතු කිරීම සඳහා අධිකාරී බලය ඇත්තේ කා හටද;

(iii) ඔවුන්ගේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

525/'19

ගරු මයන්ත දිසානායක මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති අස්වද්දන ලද මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට වී වගා කර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ තිබෙන පුරන් කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එම ඉඩම් වගා කිරීම සඳහා කඩිනම් සැලැස්මක් ක්‍රියාත්මක වන්නේද;

(v) වී වගාව සඳහා අවශ්‍ය බීජ හා පොහොර නිසි පරිදි අප්‍රමාදව සැපයීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(vi) වී මිලදී ගැනීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වී වගාව සඳහා තරුණ පරපුර ඉදිරිපත් නොවීම හේතුවෙන් සිදු වන ශ්‍රම බලකාය අඩුවීම සම්බන්ධයෙන් කිසියම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(ii) වගාවට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර පහසු හා සහන මිල ක්‍රමයකට ලබා දීමට සැලසුම් කර තිබේද ;

(iii) තරුණ පරපුර කෘෂිකර්මාන්තයට යොමු කිරීම සඳහා ආකර්ෂණීය සැලැස්මක් ක්‍රියාත්මක වන්නේ නම්, එය කවරේද;

(iv) ගොවීන්ගේ දරුවන්ට කෘෂිකර්ම අංශයේ රැකියා අවස්ථා ලබාදීම සඳහා වූ විශේෂ සැලැස්මක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

529/'19

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016.01.01 දින සිට 2017.04.30 දින දක්වා ජනාධිපතිවරයා විසින් සිදුකර ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල්වල නම් කවරේද;

(iii) එක් එක් සංචාරය සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජනාධිපතිවරයා සමඟ එක් එක් සංචාරය සඳහා සහභාගී වූ අමාත්‍යවරයන්, මන්ත්‍රීවරයන් සහ නිලධාරීන් ඇතුළු සමස්ත සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ජනාධිපතිවරයා සමඟ සංචාරවලට සහභාගි වූ සෙසු පුද්ගලයන්ගේ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

547/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ, තමිල්චෝලෙ යන නමින් යුත් පාසලක් පැවති බව දන්නේද;

(ii) එසේ නම්, එම පාසල ආරම්භ කළ දිනය කවරේද;

(iii) එම විදුහලේ අධ්‍යාපනය ලැබූ සිසුන් අවසන් වරට පහ වසර ශිෂ්‍යත්ව විභාගයට සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිට ප්‍රතිඵල නිකුත් කළ වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ මෙම පාසල හඳුන්වනු ලබන නම කවරේද;

(ii) මෙම පාසල නම් කරනු ලැබුවේ කවුරුන් විසින්ද;

(iii) එලෙස නම වෙනස් කරන ලද දිනය කවරේද;

(iv) පාසලේ නම වෙනස් කිරීම තුළින් මෙම පාසලේ නිර්මාතෘ, නැතහොත්, ආදිකර්තෘ යන නම කවරෙකුට හෝ ලබාගත හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

563/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය මාසවල වයඹ පළාතේ දැඩි නියඟයක් පැවති බව දන්නේද;

(ii) එසේ නම්, එම කාලසීමාව තුළ ගල්ගමුව මැතිවරණ කොට්ඨාසයේ පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නියං සහනාධාර ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ට ලබා දුන් සහන මල්ලේ තිබූ වියළි ආහාරවල මිල ගණන් වෙළෙඳපොළේ මිලට වඩා ඉහළ බවට චෝදනාවක් නැගී ඇති බව දන්නේද;

(v) එසේ නම්, මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

582/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 181ට අනුව, රත්‍රන් ආනයනය සඳහා බලපත්‍ර 50ක් නිකුත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එකී බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් විසින් ගෙවූ බලපත්‍ර ගාස්තු පිළිබඳ විස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) වර්ෂ 1977 සිට මේ දක්වා ලෝක වෙළෙඳපොළෙහි රත්‍රන් මිල හැසිරීම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iv) බදු රහිතව ශ්‍රී ලංකාවට රත්‍රන් ආනයනය කරනු ලබන තැනැත්තන්ගේ නම් කවරේද;

(v) ශ්‍රී ලංකාව රත්‍රන් ආනයනය කරනු ලබන ප්‍රධාන සැපයුම්කරුවන් සහ රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

596/'19

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතුකරයේ ජීවත්වන ලක්ෂ 08කට ආසන්න ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් වතුකරයේ රෝහල් රජයට පවරා ගැනීමේ වැඩපිළිවෙළක් පසුගිය රජය විසින් ක්‍රියාත්මක කළ බව පිළිගන්නේද;

(ii) එම වැඩපිළිවෙළ අනුව, 2014 වර්ෂය අවසන් වනවිට එලෙස රජයට පවරාගෙන ඇති වතු රෝහල් සංඛ්‍යාව, රෝහලේ නම සහ පවරාගත් කාලවකවානුව කවරේද;

(iii) මේ වනවිට එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන බව පිළිගන්නේද;

(iv) මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය වාර්ෂිකව වැයකළ මුදල ඉදිරිපත් කරන්නේද;

(v) වතුකරයේ සෞඛ්‍ය තත්ත්වය නගාසිටුවීමට මෙම ව්‍යාපෘතිය මඟින් විශාල පිටුවහලක් වූ බැවින් එය කඩිනමින් නැවත ආරම්භ කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 මාර්තු 11 වැනි සඳුදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

15/’18

ගරු හේෂා විතානගේ මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේදී ප්‍රථම උපාධිය සහ පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගෙන ඇති විදේශීය ශිෂ්‍යයන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ප්‍රථම උපාධිය හා පශ්චාත් උපාධිය හැදෑරීමට ඇතුළත් වූ ඉහත ශිෂ්‍ය සංඛ්‍යාව, එක් එක් විශ්වවිද්‍යාලය සහ උපාධි පාඨමාලාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2017 වර්ෂයේදී ඉහත සඳහන් ශිෂ්‍යයන් ඇතුළත්වීම මඟින් ලැබූ ආදායම කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා තවදුරටත් වැඩි විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

76/’18

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2018 මැයි මාසයේදී ඇති වූ හදිසි ජල ගැලීම්වලින් පීඩාවට පත් ජන සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හානි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(iii) හානි වූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ආපදා සහන කටයුතු සඳහා රජය වෙන්කළ මුදල කොපමණද;

(v) වන්දි වශයෙන් ගෙවන ලද මුදල කොපමණද;

(vi) වන්දි ලබාදුන් පවුල් සංඛ්‍යාව කොපමණද;

(vii) මේ වනවිට වන්දි ලබාදී නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(viii) වන්දි ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

127/’18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව විසින් ඉඩම් ඔප්පු ලබාදීමේ වැඩසටහනක් දියත් කර තිබේද;

(ii) එසේ නම්, වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව මේ දක්වා ලබා දී ඇති ඔප්පු සංඛ්‍යාව කොපමණද;

(iii) ඔප්පු ලබා දී ඇති පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් පදිංචි ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iv) මෙම ඉඩම් ඔප්පු ලබාදීමට පළාත් සභාව අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

197/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව, ජපානය, ප්‍රංශය, චීනය, ඉන්දියාව හා ස්විට්සර්ලන්තය යන රටවල් සඳහා වර්ෂ 2010 සිට මේ දක්වා පත් කරන ලද තානාපතිවරුන් හෝ මහ කොමසාරිස්වරුන් කවුරුන්ද;

(ii) ඔවුන් අතරින් විදේශ සේවයට අයත් නිලධාරින් හා විදේශ සේවයට අයත් නොවන නිලධාරින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පත්කරන ලද දිනය වනවිට විදේශ සේවයට අයත් නිලධාරින්ගේ විදේශ සේවා පළපුරුද්ද හා අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iv) පත්කරන ලද දිනය වනවිට විදේශ සේවයට අයත් නොවන නිලධාරින්ගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

256/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

331/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ බස් නැවතුම්පොළ මගී ආවරණවල විශාල අඩුවක් ඇති බව දන්නේද;

(ii) වර්ෂා කාලයේදී පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශාල පිරිසක් මෙම මගී ආවරණ ප්‍රයෝජනයට ගන්නා බවත්;

(iii) දැනට ඇති මගී ආවරණ නිසි ප්‍රමිතියෙන් තොරව සකස් කර ඇති නිසා අබලන් තත්ත්වයට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර අත්‍යවශ්‍ය ස්ථානවල මගී ආවරණ ඉදිකිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

360/'18

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි 08 වැනි දින වනවිට සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) ගෙවීමට හිඟව තිබූ මුදල කොපමණද;

(ii) එම හිඟ මුදලෙන් 2015, 2016 සහ 2017 වර්ෂවලදී පියවන ලද මුදල කොපමණද;

(iii) 2015 ජනවාරි 08 වැනි දින වනවිට සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම විසින් සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට (ETF) ගෙවීමට නියමිතව තිබූ හිඟ මුදල කොපමණද;

(iv) එම හිඟ මුදලෙන් 2015, 2016, 2017 යන වර්ෂවලදී පියවන ලද මුදල කොපමණද;

(v) 2015 ජනවාරි 08 වන දින වනවිට සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම විසින් ගෙවීමට නියමිතව තිබූ පාරිතෝෂික දීමනා (Gratuity) හිඟ මුදල කොපමණද;

(vi) එම හිඟ මුදලෙන් 2015, 2016, 2017 යන වර්ෂවලදී පියවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

408/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වසර 8 කට වැඩි කාලයක් සේවය කර ඇති උප පොලිස් පරීක්ෂකවරුන්ට පොලිස් පරීක්ෂක තනතුර ලබාදෙන බවට හිටපු විෂය භාර අමාත්‍යවරයා විසින් ජනමාධ්‍යයට ප්‍රකාශ කළ බව පිළිගන්නේද;

(ii) එම උසස්වීම් මේ දක්වා ලබා නොදීමෙන් එම නිලධාරින් කනස්සල්ලට පත් වී ඇති බව දන්නේද;

(iii) එබැවින් පොරොන්දු වූ පරිදි එම උසස්වීම් ලබාදීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම උසස්වීම් බලාත්මක වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

460/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම් දිස්ත්‍රික්කය තුළ අලුතින් ස්ථාපනය කිරීමට යෝජනා කර ඇති පළාත් පාලන ආයතන ස්ථාපනය කිරීමේදී සලකා බලන කරුණු කවරේද;

(ii) එම පළාත් පාලන ආයතනවලට අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරි වසම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

487/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් පළාත් පාලන ආයතනයට අයත් වන ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව හා පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) මහනුවර දිස්ත්‍රික්කය සඳහා අලුතින් ස්ථාපිත කිරීමට යෝජිතව ඇති පළාත් පාලන ආයතන කවරේද;

(v) මහනුවර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන බලගැන්වීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

531/'19

ගරු බිමල් රත්නායක මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004.12.26 දින ඇති වූ සුනාමි විපතට මුහුණ දුන් හම්බන්තොට නගර සභා නිවාස පාරේ අංක 3/19 දරන නිවසේ පදිංචිව සිටි ටී. එන්. අමීර් මහතා ඇතුළු 68 දෙනෙකුගේ ඉඩම් 2010.03.17 දින වෙරළ උද්‍යානයක් ඉදිකිරීම සඳහා පවරාගත් බවත්;

(ii) පවරාගත් ඉඩම් සඳහා ඉහත සඳහන් පිරිසට මෙතෙක් වන්දි ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

548/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ, පූනගරි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කිළි/ මුළංගාවිල් මහා විද්‍යාලය නමින් ජාතික පාසලක් තිබෙන බවත්;

(ii) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ තිබෙන ජාතික පාසල් දෙක අතරින් ගුරු හිඟය, කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ හිඟය, ඩෙස්ක් පුටු හිඟය හා වෙනත් සම්පත් ඌනතාවලින් දැඩි ලෙස පීඩාවට පත් වී තිබෙන්නේ කිළි / මුළංගාවිල් මහා විද්‍යාලය බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කිළි / මුළංගාවිල් මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා, නියෝජ්‍ය විදුහල්පතිවරයා, ගුරුවරුන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) ඉහත පාසලේ පවතින සුළු සේවකයන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු නොකිරීමට හේතු කවරේද;

(iii) මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර සිටීම තුළින් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය කළ හැකි වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාසලෙහි ගොඩනැගිලි අවශ්‍යතාවයන් සපුරනු ලබන දිනය කවරේද;

(ii) ඩෙස්ක් පුටු හිඟය මුළුමනින්ම සපුරනු ලබන දිනය කවරේද;

(iii) මෙම පාසලෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

561/'19

ගරු අ. අරවින්ද් කුමාර් මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ දේශීය හා විදේශීය අරමුදල් ලැබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී භාණ්ඩ ඇනවුම් කිරීම සහ තත්ත්ව පරීක්‍ෂණ සඳහා නිලධාරින් විදේශගත වූ අවස්ථාවල එම විදේශ සංචාර වෙනුවෙන් වැය වූ මුදල ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ හෝ ව්‍යාපෘතියේ පිරිවැයට ඇතුළත් වන්නේද;

(ii) ඒ පිළිබඳ විස්තර සියල්ල ඉදිරිපත් කරන්නේද;

(iii) ඇනවුම් කළ භාණ්ඩවල තත්ත්ව පරීක්‍ෂණ කටයුතු සඳහා නිලධාරින් වරින් වර විදේශගත වීමේදී ඔවුන්ගේ සේවා අවශ්‍යතා ආවරණය කළද, එයින් සිදුවන අධික පාඩුව අවම කර ගැනීමට අදාළ භාණ්ඩ නියැදි ගෙන්වා ගැනීම හෝ එම භාණ්ඩ ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙන්වා තත්ත්ව පරීක්ෂණ කටයුතු සිදු කිරීම කෙරෙහි අවධානය යොමු කරන්නේද;

(iv) නොඑසේ නම්, භාණ්ඩ තත්ත්ව පරීක්ෂණ කටයුතු සිදු කිරීම පිණිස සුදුසු වෙනත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

564/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වනවිට වයඹ පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම තැලසීමියා රෝගීන් වාර්තා වී ඇති බව පිළිගන්නේද;

(ii) එම රෝගීන් වෙනුවෙන් කුරුණෑගල ශික්ෂණ රෝහලේ ජාතික තැලසීමියා මධ්‍යස්ථානයට අයත් තැලසීමියා රෝග නිවාරණ ඒකකය මඟින් විශාල සේවාවක් සිදුවන බව දන්නේද;

(iii) එහෙත් එම ඒකකයට අවශ්‍ය මානව සම්පත් සහ වාහන ඇතුළු වෙනත් භෞතික සම්පත් ප්‍රමාණාත්මකව ලැබී නොමැති බව දන්නේද;

(iv) එම ඒකකයට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

583/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 161ට අනුව, තේ සහ රබර් කර්මාන්තය උනන්දු කරවීම සඳහා, එකී වගාවන්හි නියුතු සමාගම්වලට වසර දෙකක බදු නිදහස් කිරීමක් ලබා දී තිබේද;

(ii) උක්ත යෝජනාවට අනුව, එකී බදු නිදහස ලබා ගත් සමාගම් ලැයිස්තුව ඉදිරිපත් කරන්නේද;

(iii) උක්ත බදු නිදහස ලබා දීමෙන් රජයට අහිමි වූ බදු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 මාර්තු 12 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

16/'18

ගරු හේෂා විතානගේ මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීතිපති දෙපාර්තමේන්තුවේ සිටින රජයේ අධිනීතිඥවරුන් සංඛ්‍යාව සහ රජයේ නීතිඥවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නීතිපති දෙපාර්තමේන්තුවේ වගකීම් ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය රජයේ අධිනීතිඥවරුන් සහ රජයේ නීතිඥවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීතිපති දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

77/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්තාගත පොල් නිෂ්පාදනය;

(ii) එකී කාලසීමාව තුළ වාර්ෂිකව අපනයනය කළ පොල් ප්‍රමාණය;

(iii) එම කාලසීමාව තුළ වාර්ෂිකව ආනයනය කළ පොල් ප්‍රමාණය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ආ) (i) පසුගිය කාලයේදී අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් පොල් ඵලදාව අඩුවීම සම්බන්ධයෙන් පිළියම් යෙදීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

(ii) ගොවීන් වෙත සහනාධාර පදනම යටතේ පොහොර ලබා දී තිබේද;

(iii) එසේ නම්, ලබා දුන් පොහොර ප්‍රමාණය සහ පොහොර ලබා දුන් ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ යටතේ ආවරණය වන පොල් අක්කර ප්‍රමාණය කොපමණද;

(v) මෙතෙක්, පොහොර සහනාධාරය ලබා දී නොමැති නම්, ඒවා ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

128/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඩෙංගු රෝගය රට පුරා ව්‍යාප්ත බව දන්නේද;

(ii) එසේ නම්, 2015 වර්ෂයේ සිට මේ දක්වා ඩෙංගු රෝගයෙන් මියගිය සංඛ්‍යාව, එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පළාත් පාලන ආයතන නිසි පරිදි සිය කටයුතු ඉටු නොකිරීම නිසා ඩෙංගු රෝගය ව්‍යාප්ත වන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා පළාත් පාලන ආයතන බල ගැන්වීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

204 /'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේ විසර්ජන පනත පරිපූරක ඇස්තමේන්තු හා වෙනත් අතිරේක ප්‍රතිපාදන මඟින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත වෙන් කළ මුදල් ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2017 වර්ෂය තුළ එම අමාත්‍යාංශය මඟින් වියදම් කළ මුළු මුදල කොපමණද;

(iii) එය වෙන් කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) ඉතිරි වූ මුදල් ප්‍රතිපාදනය කොපමණද;

(v) එය වෙන් කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

239/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "විසල් දඹුල්ල" ජල යෝජනා ක්‍රමය ආරම්භ කළ හා අවසන් කළ දින කවරේද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iii) ඒ යටතේ ලබා දී ඇති ජල සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

(iv) එම ජල සම්බන්ධතා ලබා දී ඇති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(v) ජල දුෂ්කරතාවයන්ට මුහුණපාන මාතලේ දිස්ත්‍රික්කයේ සෙසු ජනතාවටද ජල සම්බන්ධතා ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

261/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

334/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමෘද්ධි සහනාධාර ලබාදීමේදී ගැටලු රාශියක් ඇති බවත්;

(ii) මේ වනවිට සමෘද්ධි සහනාධාර සඳහා සුදුසුකම් ලබා ඇති පුද්ගලයන්ට සමෘද්ධි සහනය නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර, සමෘද්ධි සහනාධාර ලබාදීමේ ගැටලු විසඳනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

362/'18

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු බෝපිටිය වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, ලියාපදිංචි සාමාජික අංකය, සේ.නි.භා.අරමුදල්, සේ.අ. අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

463/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් කවරේද;

(iii) එම එක් එක් වැවට අයත් භූමිවල දැනට අනවසරයෙන් රැඳී සිටින හා වගා කටයුතු වල නිරත වන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම වැව් සතු භූමිවල අනවසරයෙන් රැඳී සිටින හා වගා කටයුතුවල නිරත පවුල් ඉවත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

489/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වූ පාසල් වැසීගොස් තිබේ නම්, එම පාසල් වල නම් කවරේද;

(iv) එම පාසල් නැවත විවෘත කිරීමට හෝ වැසීගිය පාසල්වල සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට අමාත්‍යාංශය අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

515/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ''සහභාගිත්ව සංවර්ධන වැඩසටහන්'' යටතේ 2015 වර්ෂයේ සිට මේ දක්වා නිලධාරීන් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිලධාරීන් සඳහා මාසික වැටුපක් හෝ දීමනාවක් ගෙවන්නේ නම්, ඒ කොපමණද;

(iv) එසේ බඳවාගත් එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, අයත් වන ග්‍රාම නිලධාරී වසම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යන තොරතුරු අඩංගු ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(vi) එම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ඵලදායී ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

526/'19

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උඩරට ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව පසුගිය රජය විසින් අහෝසි කිරීම හේතුවෙන් උඩරට ප්‍රදේශයේ ජනතාවට අසාධාරණයක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උඩරට සංවර්ධන අධිකාරියෙන් උඩරට ප්‍රදේශයට හිමි වූ සංවර්ධන ප්‍රතිලාභ කවරේද;

(ii) එම අධිකාරියට වෙන් කළ මුදල කොපමණද;

(iii) එම අධිකාරියෙන් සිදු කළ කාර්යයන් සහ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති කවරේද;

(iv) උඩරට සංවර්ධන අධිකාරියේ සභාපතිත්වය සහ ආයතනික වගකීම් දරන ලද පුද්ගලයන් කවුරුන්ද;

(v) උඩරට සංවර්ධන අධිකාරිය මඟින් උඩරට ප්‍රදේශයේ දිළිඳු ගම්මානවල ජනතාවට ලබාදුන් රැකියා සහ රැකියා සංඛ්‍යාව කවරේද;

(vi) උඩරට සංවර්ධන අධිකාරිය මඟින් දිළිඳු ගම්මානවල ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ආරම්භ කළ ව්‍යාපෘතිවල නම් සහ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව නැවත ආරම්භ කිරීමට අදහස් කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

532/'19

ගරු බිමල් රත්නායක මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොරියානු රැකියා සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා පිටත්ව යන ශ්‍රමිකයන්ගෙන් රුපියල් ලක්ෂ පහක මුදලක් ආරක්ෂිත තැන්පතුවක් ලෙස භාරගන්නා බවත්;

(ii) ඒ හේතුවෙන් කොරියානු රජයේ රැකියා සඳහා යන ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන තරුණ තරුණියන් විශාල අපහසුවකට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම නීතිය අහෝසි කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

550/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනෙහි දිස්ත්‍රික්ක විසිපහ සඳහා ක්‍රිකට් සංගම් විසිපහක් තිබේද;

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අවසර ලබා නොදීමට හේතු කවරේද;

(iii) කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලියාපදිංචිය සඳහා කිහිපවිටක්ම අයදුම් කර ඇතත්, මෙතෙක් එය ලියාපදිංචි නොකිරීමට හේතු කවරේද;

(iv) 2010 වර්ෂයෙන් පසුව කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයට ඔබ අමාත්‍යාංශය විසින් ලබා දී ඇති ආධාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

584/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 206ට අනුව, 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම පනත මඟින් අපහසුතාවයට පත් කරන ලද ආයෝජකයන්ගේ සහ ව්‍යාපාරවල නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(ii) 2011 අංක 43 දරන පනත මඟින් අපහසුතාවයන්ට පත් වූ ව්‍යාපාරවලට සහන ලබාදීමට හෝ පහසුකම් ලබාදීමට රජය විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

(iii) උක්ත අයවැය යෝජනාව අනුව, දේශීය හා ගෝලීය ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ හෝ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන නව නීති රීති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 මාර්තු 13 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

17/'18

ගරු හේෂා විතානගේ මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා,

(i) ගෘහ සේවිකාවන් ලෙස විදෙස්ගත වූ කාන්තාවන් සංඛ්‍යාව;

(ii) ගෘහ සේවිකාවන් ලෙස විදෙස්ගත වූ කාන්තාවන් අතර සිටින මව්වරුන් සංඛ්‍යාව;

(iii) ගෘහ සේවිකාවන් ලෙස විදෙස්ගත වී විවිධ වූ හිංසනයන්ට ලක්වී ශ්‍රී ලංකාවට පැමිණි හා මියගිය කාන්තාවන් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බාල වයස්කාර දරුවන් සිටින මව්වරුන් විදෙස්ගත වීම හේතුවෙන් ඔවුන්ගේ දරුවන්ට අගතිදායක බලපෑමක් ඇති වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, බාල වයස්කාර දරුවන් සිටින කාන්තාවන් ගෘහ සේවිකාවන් ලෙස විදෙස්ගත වීම වැළැක්වීමට අමාත්‍යාංශය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

78/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 සහ 2017 වර්ෂවලදී ඇති වූ නියං සහිත කාලගුණ තත්ත්වය හේතුවෙන් විනාශයට පත් වූ පොල් ගස් සංඛ්‍යාව පිළිබඳව සංගණනයක් කර තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කවරේද;

(iii) නියඟය හේතුවෙන් දැඩි හානියට ලක් වූ දිස්ත්‍රික්ක කවරේද;

(iv) එම හානිය මත පොල් නිෂ්පාදනයට සිදුව ඇති බලපෑම පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විනාශ වූ පොල් ගස් වෙනුවට අලුතින් පැල සිටුවීමට මේ වනවිට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, බෙදා දී ඇති පොල් පැළ සංඛ්‍යාව කොපමණද;

(iii) එම පොල් පැළ සම්පූර්ණයෙන්ම නොමිලේ ලබා දී තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා රජය වැය කළ මුදල කොපමණද;

(v) නොඑසේ නම් පැළයක් සඳහා අය කළ මුදල කොපමණද;

(vi) මේ වනතෙක් පොල් පැළ ලබා දී නොමැති නම්, පොල් පැළ ලබාදෙනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

129/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපනය කරන ලද වර්ෂය කවරේද;

(ii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ ආරම්භක අරමුණු කවරේද;

(iii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපිත කළ දින සිට අවසන් අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා එහි අධ්‍යක්ෂ මණ්ඩලවල සිටි පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ ලැබූ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ආරම්භයේ සිට ලැබූ අලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ණය, ලබාගත් ණය ගෙවීමට ඇති රාජ්‍ය ආයතන හා එම ණය ප්‍රමාණයන් කවරේද;

(vi) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ අනාගතය සම්බන්ධයෙන් රජය ගැනීමට බලාපොරොත්තුවන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

198/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශයන්හි පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලය නඩත්තු කිරීම සඳහා 2017 වර්ෂයේදී වියදම් කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්ෂ 2013 සිට 2017 දක්වා විදේශ දූත මණ්ඩල කාර්යාල නඩත්තු කිරීම වෙනුවෙන් වියදම් කළ මුළු මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

257/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

332/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් ආශ්‍රිතව මිරිදිය කර්මාන්තයේ යෙදෙන ධීවරයන් විශාල පිරිසකට තවමත් ස්ථිර නිවාස නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) ඒ සඳහා නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

461/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 සිට අද දක්වා,

(i) වයඹ පළාත් සභාවට ආදායම් ලැබුණු මූලාශ්‍ර කවරේද;

(ii) වයඹ පළාත් සභාවේ ආදායම හා වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වයඹ පළාත් සභාවේ වාර්ෂික පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පුනරාවර්තන වියදම හා ප්‍රාග්ධන වියදම යටතේ මුදල් වැය කරනු ලැබූ ක්ෂේත්‍ර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) යහපාලන රජයේ යහපත් මූල්‍ය කළමණාකරණ ප්‍රතිපත්ති අනුව වයඹ පළාත් සභාව මෙහෙයවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

585/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 208ට අනුව, ආරක්ෂණ ආයෝජන ගිණුම් ක්‍රමය අහෝසි කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) උක්ත යෝජනාවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරව ස්වකීය මුදල් තබාගෙන සිටින ශ්‍රී ලාංකිකයන්ට එම මුදල් මව්බිමට රැගෙන එන ලෙසට කරන ලද ඉල්ලීමට මෙතෙක් ලැබී ඇති ප්‍රතිචාර කවරේද;

(iv) උක්ත අයවැය යෝජනාවට අනුව, බැංකු ගිණුම් ක්‍රමය හරහා පිටරට තබාගෙන තිබෙන මුදල් මෙරටට ප්‍රේෂණය කරන කිසිම පුද්ගලයෙකුට එරෙහිව රජය විසින් නෛතික පියවර නොගන්නා බව නිශ්චිතව සඳහන් කිරීමට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා නෛතික බලය ලබාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 මාර්තු 14 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

18/'18

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඇඹිලිපිටිය මූලික රෝහලේ,

(i) වාට්ටු සංඛ්‍යාව;
(ii) රෝගීන් සඳහා වූ ඇඳන් සංඛ්‍යාව;
(iii) ශල්‍යාගාර සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශාල ප්‍රදේශයක් ආවරණය කරමින් මෙම රෝහල මඟින් සේවාව ලබාදෙන නමුත්, ඊට සරිලන පරිදි ප්‍රමාණවත් පහසුකම් නොමැති බව පිළිගන්නේද;
(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

130/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වියළුව මැතිවරණ කොට්ඨාසයේ, මීගහකිවුල අධ්‍යාපන කොට්ඨාසය තුළ බ/කරඳගහමඩ විද්‍යාලය නමින් පාසලක් තිබෙන බව දන්නේද;
(ii) එසේ නම්, එම පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) ස්ථිර ක්‍රීඩා පිටියක් නොමැති වීම නිසා, පසුගියදා එම පාසලේ ක්‍රීඩා උත්සවය අසළ පිහිටි මාර්ගයක පැවැත්වූ බව දන්නේද;
(iv) දුෂ්කර පළාතක පිහිටි මෙම පාසලේ අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

200/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂය සඳහා විසර්ජන පනත මඟින්, පරිපූරක ඇස්තමේන්තු මඟින් හා වෙනත් අතිරේක ප්‍රතිපාදන මඟින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කවරේද;
(ii) 2017 වර්ෂය තුළ එම අමාත්‍යාංශය මඟින් වියදම් කළ මුළු මුදල කොපමණද;
(iii) එය වෙන් කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;
(iv) ඉතිරි වූ ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;
(v) එය වෙන් කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

258/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස්, හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

333/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවැලි කලාපයට අයත් ගල්නෑව නගරය මේ වනතෙක් කිසිදු සංවර්ධන සැලැස්මකට භාජනය නොවූ නගරයක් බවත්;

(ii) ඉතාම ජනාකීර්ණ නගරයක් වන මෙය ප්‍රමිතියෙන් තොර තත්ත්වයකට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගල්නෑව නගරය ප්‍රමිතියෙන් යුත් නගරයක් බවට පත් කිරීමේ වැඩකටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

361/'18

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු හන්තාන වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, ලියාපදිංචි සාමාජික අංකය, සේ.නි.භා.අරමුදල්, සේ.අ.අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

462/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව මේ දක්වා විදේශ ගත වූ වයඹ පළාත් සභාවේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ විදේශ ගතවූ නිලධාරීන්ගේ නම් සහ තනතුරු නාම කවරේද;

(iii) ඔවුන් විදේශගත වූ රටවල් කවරේද;

(iv) ඒ සඳහා වැයකරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විදේශ සංචාර සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී, වයඹ පළාත් සභාව අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

533/'19

ගරු බිමල් රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මනෝ උපදේශනය සඳහා විධිමත් පුහුණුවක් සහිත ගුරුවරුන් 2753ක් බඳවා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාකරන බවට 2017 ජනවාරි මාසයේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල පුවත් පළවූ බවත්;

(ii) 2017.08.11 දින ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාද ඒ බව තහවුරු කරමින් ප්‍රකාශයක් කළ බවත්;

(iii) මේ වනවිට දර්ශනය හා මනෝවිද්‍යාව හදාරන ලද උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් රැකියා විරහිතව සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාධ්‍ය වාර්තා අනුව මනෝවිද්‍යා උපදේශන ගුරුවරුන් 2753ක් බඳවා ගැනීමට ක්‍රියාකරන්නේද;

(ii) එසේ නම්, එම බඳවා ගැනීම් සිදු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 මාර්තු 15 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

19/'18

ගරු හේෂා විතානගේ මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ආරම්භයේ සිට මේ දක්වා,

(i) යොදවන ලද සමස්ත ප්‍රාග්ධන හා සංචිත ප්‍රමාණය;

(ii) කොටස් මත ලද ආදායම සහ වත්කම් මත ලද ආදායම් ප්‍රමාණය;

(iii) සමස්ත සේවක සංඛ්‍යාව සහ එක් සේවකයකු වෙනුවෙන් වැය කළ මුළු මුදල් ප්‍රමාණය;

(iv) පුනරාවර්තන නොවන වියදම;

(v) බදු ලෙස රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණය;

(vi) ලාභය හෝ අලාභය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත තොරතුරු පෞද්ගලික අංශයේ බැංකු ආයතනයක් හා සංසන්දනාත්මකව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

79/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට මාසික පරිභෝජනය සඳහා අවශ්‍ය කුකුල් මස් ප්‍රමාණය කොපමණද;

(ii) මෙරට මාසික කුකුල් මස් නිෂ්පාදනය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට කුකුල් මස් ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(ii) මාසිකව ආනයනය කරනු ලබන මස් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවෙන් කුකුල් මස් අපනයනය කරනු ලබන රටවල් කවරේද;

(iv) මාසිකව අපනයනය කරනු ලබන මස් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මස් නිෂ්පාදනය කරනු ලබන කුකුළු ගොවිපොළවල් වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ කවරේද;

(ii) කුකුල් මස් කිලෝවක නිෂ්පාදනය පිරිවැය කොපමණද;

(iii) මේ වනවිට වෙළඳපොළේ කුකුල් මස් කිලෝවක තොග මිල කොපමණද;

(iv) කුකුල් මස් නිෂ්පාදනය සහ අලෙවිය සඳහා රජයෙන් ලබා දී ඇති සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

240/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි ගඟේ වැලි ගොඩ දැමීම සඳහා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බලපත්‍ර ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) මෙම බලපත්‍ර ලබා දීම හේතු කොට ගෙන විල්ගමුව ප්‍රදේශයේදී මහවැලි ගඟට විශාල පාරිසරික හානියක් සිදුවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම හානිය වැළැක්වීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

259/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

488/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ජාත්‍යන්තර පාසල්වල ගුරුවරුන් බඳවා ගැනීම, ගාස්තු අයකිරීම වැනි කටයුතු නියාමනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

534/'19

ගරු බිමල් රත්නායක මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්තල, ගොඟිංතොට, අංක 656/102/5 ඒ දරන ස්ථානයේ පදිංචි සුසන්ත අමරසිංහ මහතා දීර්ඝ කාලයක් සිදු කරන ලද පර්යේෂණවලට අනුව ඉවතලන අපද්‍රව්‍යවලින් බ්ලොක් ගල් නිෂ්පාදනය, මාර්ග කාපට් කිරීම ඇතුළු නව සොයා ගැනීම් 12ක් පමණ සිදුකර ඇති බවත්;

(ii) මේ පිළිබඳව මුද්‍රිත මාධ්‍ය මඟින් අවස්ථා ගණනාවකදීම ප්‍රසිද්ධියක් ලබාදී ඇති බවත්;

(iii) අමරසිංහ මහතාට මෙම කර්මාන්තය දියුණු කර, රටට සේවාවක් සැපයීම සඳහා සහාය ලබාදෙන මෙන්, ඔබ අමාත්‍යාංශයෙන්ද ඉල්ලීමක් කර ඇති බවත්;

(iv) එහෙත්, මේ වනතෙක් කිසිදු සහායක් ලබා දී නොමැති බවත්;

(v) මේ වනවිට විවිධ තැරැව්කරුවන් මඟින් ඔහුගේ තාක්ෂණික ඥානය මුදලට ලබාගැනීමට විදේශීය නියෝජිතයන් උත්සාහ කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අමරසිංහ මහතාගේ මෙම සොයාගැනීම් උපයෝගී කරගනිමින් ඔහුගේ නිෂ්පාදන රටට හඳුන්වාදීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) එම පියවර ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

586/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 209ට අනුව, හම්බන්තොට වරාය හරහා යන මුහුදු මාර්ගයෙහි, වාර්ෂිකව තෙල් නැව් 4,500 ක් ඇතුළු නෞකා 35,000 භාවිතා කරනු ලබන බව සඳහන් කර, ගැඹුරු මුහුදේ තෙල් සැපයීමේ කාර්යයට පිවිසීමට පෞද්ගලික අංශය දිරි ගන්වන බවට යෝජනා කළ බව පිළිගන්නේද;

(ii) උක්ත යෝජනාව ප්‍රායෝගික යථාර්ථයක් බවට පත්කිරීම සඳහා මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) උක්ත යෝජනාව අනුව, එකී කාර්යයට බලපත් ලබාදීම සඳහා විනිවිදභාවයෙන් යුත් ලංසු කැඳවීමේ ක්‍රියාවලියක් අනුගමනය කරනු ලැබුවේද;

(iv) ඒ අනුව, ගැඹුරු මුහුදේ තෙල් සැපයීමට බලපත් ලබාගත් පාර්ශ්වකරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 මාර්තු 16 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

20/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා යුද හමුදාව වෙනුවෙන් ආහාර සඳහා මස් වර්ග ලබාදුන් සැපයුම්කරුවන්ගේ නම් කවරේද;

(ii) යුද හමුදාව සඳහා මස් සැපයුම්කරුවන් තෝරා ගනු ලබන ආකාරය කවරේද;

(iii) මෙම කාලය තුළ එක් එක් මස් වර්ගය සඳහා වාර්ෂිකව, ගෙවන ලද මුළු මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඒ සඳහා තවදුරටත් ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) එම එක් එක් මස් වර්ගයේ වාර්ෂික අවශ්‍යතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

80/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මාසික පරිභෝජනය සඳහා අවශ්‍ය බිත්තර ප්‍රමාණය කොපමණද;

(ii) මෙරට මාසික බිත්තර නිෂ්පාදනය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට බිත්තර ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(ii) මාසිකව ආනයනය කරනු ලබන බිත්තර ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවෙන් බිත්තර අපනයනය කරනු ලබන රටවල් කවරේද;

(iv) මාසිකව අපනයනය කරනු ලබන බිත්තර ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බිත්තර නිෂ්පාදනය කරනු ලබන කුකුළු ගොවිපොළවල් වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ කවරේද;

(ii) බිත්තරයක නිෂ්පාදන පිරිවැය කොපමණද;

(iii) මේ වනවිට වෙළඳපොළේ බිත්තරයක තොග මිල කොපමණද;

(iv) බිත්තර නිෂ්පාදනය සහ අලෙවිය සඳහා රජයෙන් ලබා දී ඇති සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

132/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ "ලුණුගල බේසම්වල" නමින් සංචාරක අවධානයක් දිනාගත් ප්‍රදේශයක් තිබෙන බවත්;

(ii) එම ස්ථානය හා එම ස්ථානය අවට දැඩි පරිසර දූෂණයකට ලක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ස්ථානයේ සිදුවන පරිසර දූෂණය අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

203/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂය සඳහා විසර්ජන පනත මඟින්, පරිපූරක ඇස්තමේන්තු මඟින් හා වෙනත් අතිරේක ප්‍රතිපාදන මඟින් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත වෙන් කළ මුදල් ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2017 වර්ෂය තුළ එම අමාත්‍යාංශය මඟින් වියදම් කළ මුළු මුදල කොපමණද;

(iii) එය වෙන් කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) ඉතිරි වූ මුදල් ප්‍රතිපාදනය කොපමණද;

(v) එය වෙන්කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

260/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස්, හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

535/'19

ගරු බිමල් රත්නායක මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ පිටත වටරවුම්පාර ඉදිකිරීමේදී කඩුවෙල, රග්ගහවත්ත ප්‍රදේශයේදී කැළණි ගඟේ වම් සහ දකුණු ඉවුරුවල අඩි 4ක් පමණ පස් කපා ඉවත්කර, කොන්ක්‍රීට් කණු ඉදිකර ඇති බවත්;

(ii) සෑම වසරකම පාහේ ගංවතුර උවදුරට ලක්වන රග්ගහවත්ත, හේවාගම යන ප්‍රදේශ මෙම හේතුව නිසා විශාල ගංවතුර උවදුරකට ලක්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගං ඉවුර කැපීම හේතුවෙන් දැඩි ගංවතුර උවදුරකට ලක්වීමෙන් ප්‍රදේශයේ ජනතාවට සිදු වන හානිය වැළැක්වීම පිණිස කපා දැමූ ඉවුර යථා තත්ත්වයට පත්කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

549/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිලි/කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලය නමින් ජාතික පාසලක් තිබෙන බවත්;

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන ජාතික පාසල් දෙක අතරින් එක් පාසලක් වන මෙහි ගුරු හිඟය, කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ හිඟය, ඩෙස් පුටු හිඟය හා වෙනත් සම්පත් හිඟයන්ගෙන් යුක්තව ක්‍රියාත්මක වන විද්‍යාලයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී පාසලේ විදුහල්පතිවරයා, නියෝජ්‍ය විදුහල්පතිවරයා, ගුරුවරුන් සහ අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) මෙම විද්‍යාලයේ පවතින අනධ්‍යන කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු පිරවීම සඳහා මේ දක්වා කටයුතු නොකිරීමට හේතු කවරේද;

(iii) මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර සිටීම තුළින් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කළ නොහැකි බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාසලෙහි ගොඩනැගිලි අවශ්‍යතාවයන් සපුරනු ලබන දිනය කවරේද;

(ii) ඩෙස් පුටු හිඟය මුළුමනින්ම සපුරනු ලබන දිනය කවරේද;

(iii) මෙම පාසලෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

587/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 210ට අනුව, නැව් සෑදීමේ හා කොටස් කිරීමේ කර්මාන්තය සහ නැව් අලුත්වැඩියාව දිරිගැන්වීමට හම්බන්තොට සහ ත්‍රිකුණාමල ප්‍රදේශයේ රජයේ ඉඩම් ලබාදීමට යෝජනා කළ බව පිළිගන්නේද;

(ii) දිස්ත්‍රික්ක ලේකම්වරයා විසින් සකස් කර ඇති රජයේ නිල වාර්තා අනුව, හම්බන්තොට සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයන්හි පවතින රජයේ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර කොපමණද;

(iii) රජය විසින් හඳුනාගෙන ඇති, රජය සතු එකී ඉඩම්වලින් ඵලදායී ලෙස උපයෝජනය කළ සහ නොකළ ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2016 අයවැය යෝජනා අංක 210ට අනුව, බෙදා දුන් ඉඩම් ප්‍රමාණය සහ ඒවා බෙදා දුන් පුද්ගලයන් කවුරුන්ද; කුමන කොන්දේසි යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 මැයි 10 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 11 /'18

ගරු වමින්ද විජේසිරි මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'18

ගරු වමින්ද විජේසිරි මහතා,— ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කිරීම,— රටක සංවර්ධනය සඳහා තොරතුරු වැදගත් සාධකයක් වන අතර, එම තොරතුරු සම්පාදනයේදී වැදගත් මෙහෙවරක් ඉටුකරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— හජ් වන්දනා පනතක් හඳුන්වා දීම,— වාර්ෂිකව හජ් වන්දනාවේ යෙදෙන ශ්‍රී ලාංකික බැතිමතුන් විසින් මුහුණ දෙන ගැටලු නිරාකරණය කර ගැනීමටත්, ඒ පිළිබඳ ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කොට නීතිමය ප්‍රතිපාදන සකස් කිරීමටත්, රජය මඟින් "හජ් වන්දනා පනතක්" හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කයේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය භූගෝලීය වශයෙන් සලකා බලන කල මුහුදු සීමාවෙන් දුරස්ථව පිහිටා ඇති බැවින්, එම දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලීම සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු වැව් හා ජලාශවල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කය තුළ පයිනස් වගාව හේතුවෙන් සිදුවී ඇති පරිසර හානිය අවම කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ පයිනස් වගාව හේතුවෙන් පරිසරයට දැඩි හානියක් සිදුවී ඇති බැවින්, එම පරිසර හානිය අවම කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා, — මහනුවර රෝහල් පරිශ්‍රයේ ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම,— යහපාලන රජය යටතේ මහනුවර රෝහල දෙවැනි ජාතික රෝහල ලෙස දියුණු කිරීමට පියවර ගනිමින් සිටින බැවින්, එම රෝහල් පරිශ්‍රයේ ඇති සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කඩිනමින් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අයහපත් කාලගුණය නිසා ඇතිවන වසංගත තත්ත්වයන් ව්‍යාප්තවීම වැළැක්වීම,— අයහපත් කාලගුණය නිසා ඇතිවන ජල ගැලීම් වලින් පසුව ආපදාවට ලක්වූ ප්‍රදේශවල ජලය බැස යාමත් සමඟ මී උණ, පාචනය ඇතුළු බෝවන රෝග පැතිරයාමේ අවදානමක් පවතින බවට අදාළ ප්‍රදේශවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් පෙන්වා දී ඇති බැවින්, එවැනි වසංගත තත්ත්වයන් ඇතිවීම වැළැක්වීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ගංගා ද්‍රෝණි පද්ධතියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම,— කෘෂිකාර්මික රටක් වන අප රටෙහි ගංගා ද්‍රෝණි පද්ධතියෙන් කෘෂි කර්මාන්තයට විශාල සේවාවක් ඉටුවන නමුදු, මෙම ගංගාවල ජලයෙන් විශාල ප්‍රමාණයක් භාවිතයට නොගෙන මුහුදට ගලා බසින බව විද්වත් පර්යේෂණ මඟින් පවා හෙළි වී ඇති බැවින්, මහා පරාක්‍රමබාහු රජ සමයේදී මෙන් මෙම ජල සම්පතෙන් රටේ සංවර්ධනයට උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි ආකාරයේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම,— මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාවට දක්ෂතා දක්වන විශාල පිරිසක් සිටින බැවින් එම පිරිස ජාත්‍යන්තර තලයට ගෙන යාමට හැකිවන අයුරින් මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාව ප්‍රවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය සතුව තිබූ වොලිබෝල් ක්‍රීඩාවේ අභිමානය නැවත ගොඩනැගීමට වැඩසටහනක් දියත් කිරීම,— මීට දශකයකට පමණ පෙර පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල් වලින් බිහිවූ දක්ෂ වොලිබෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තරඟ වලදී දැක්වූ දක්ෂතා නිසා පුත්තලම දිස්ත්‍රික්කයට වොලිබෝල් ක්‍රීඩාවෙන් ඉතා අභිමානවත් ස්ථානයක් හිමි වුවද, අද වනවිට එම තත්ත්වයේ යම් බිඳ වැටීමක් ඇති බැවින්, නැවත එම අභිමානය පුත්තලම දිස්ත්‍රික්කයට ගෙන ඒමට වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීම,— ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රෝටීන් ලබාදීමටත්, වාර්ෂිකව ටින් මාළු ආනයනය වෙනුවෙන් විදේශ රටවල් කරා ඇදී යන විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා මෙන්ම, ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය සියලුම සම්පත් පුත්තලම දිස්ත්‍රික්කය තුළ පවතින බැවින් ද, එම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කිරීම,— රටක සංවර්ධනය සඳහා අධිවේගී මාර්ග ඉතා වැදගත් වන බැවින් ද, යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය ඉතා වේගයෙන් සංවර්ධනය වන බැවින් ද, එම සංවර්ධන වේගය තවදුරටත් ඉහළ නැංවීම සඳහා දැනට කොළඹ සිට කටුනායක දක්වා වූ අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — වයඹ පළාතේ වැව්, ගංගා සහ ඇළ මාර්ග ආශ්‍රිතව කුඹුක් ශාඛ සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— පසේ පවතින ජලය ආරක්ෂා කිරීමේ හැකියාව මෙන්ම, පාංශු ඛාදනය අවම කිරීමේ ගුණාංග සහිත වූ දිගු ආයු කාලයක් ඇති කුඹුක් ශාඛ, වයඹ පළාතේ වැව්, ගංගා සහ ඇළ මාර්ග ආශ්‍රිතව සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— බත්තලංගුණ්ඩුව දූපත්වාසී ධීවර ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා කඩිනම් පියවර ගැනීම,— වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය අර්ධද්වීපය අසල ඇති ප්‍රධාන දූපතක් වන බත්තලංගුණ්ඩුව දූපතේ ධීවර ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳව මෙතෙක් නිසි අවධානයට ලක් නොවී ඇති බැවින්, යහපාලන රජය යටතේ එම ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා කඩිනම් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ජලජ පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— වර්තමානයේ ලෝකයේ ජලජ පැළෑටි සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර, එමගින් අපේ රටට විදේශ විනිමය උපයා ගැනීමේ පුළුල් අවස්ථාවක් උදා වී ඇති අතර, මෑතකදී ජපන් විශේෂඥයන් විසින් සිය පර්යේෂණ වාර්තාවක ජලජ පැළෑටි වගාව සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආශ්‍රිත ප්‍රදේශය ඉතා යෝග්‍ය බව පෙන්වා දී ඇති පසුබිමක ජලජ පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතියක් පුත්තලම දිස්ත්‍රික්කය තුළ ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වයඹ පළාත තුළ පිළිකා රෝහලක් ස්ථාපිත කිරීම,— වයඹ පළාත තුළ මේ වනවිට පිළිකා රෝගීන් සංඛ්‍යාව විශාල ලෙස ඉහළ ගොස් ඇති බැවින්, එම රෝගී ජනතාව වෙනුවෙන් වයඹ පළාත තුළ පිළිකා රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වයඹ පළාත තුළ ළමා රෝහලක් ස්ථාපිත කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ළමා රෝහල වන රිජ්වේ ආර්යා ළමා රෝහලේ පවතින දැඩි තදබදය අවම කිරීම සඳහා මෙන්ම, වයඹ හා උතුරු මැද පළාතේ ජනතාවට ප්‍රයෝජනවත් වන පරිදි වයඹ පළාත තුළ ළමා රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/’19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කයේ හෝටල් පාසලක් ස්ථාපිත කිරීම,— යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය සංචාරක කලාපයක් ලෙස දියුණු කිරීමට අපේක්ෂා කරන බැවින්, එම කර්මාන්තයේ දියුණුව සඳහා අවශ්‍ය මානව සම්පත පුහුණු කිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ හෝටල් පාසලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — කල්පිටිය ආශ්‍රිතව තල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,— වයඹ පළාතේ කල්පිටිය ප්‍රදේශයේ තල් ආශ්‍රිත කර්මාන්ත පසුගිය වසර කිහිපය තුළ දරුණු කඩා වැටීමකට ලක් වී ඇති බැවින්, වත්මන් රජයේ ප්‍රතිපත්තිවලට අනුව, ඉදිරියේදී කල්පිටිය ප්‍රදේශය සංචාරක පුරවරයක් වශයෙන් සංවර්ධනය කිරීමේ වැඩසටහනට සමගාමීව එම ප්‍රදේශයේ තල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ද දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නවත්වාලීම,— ශ්‍රී ලංකාව අතීතයේ පටන්ම සත්ව කරුණාව පතුරුවාලන බෞද්ධ රටක් වුවද, අද වනවිට සමහර කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නිසා සතුන් දැඩි හිංසාවකට ලක්වීමත්, අධික බිත්තර නිෂ්පාදනය තුළින් සුළු පරිමාණ කුකුළු ගොවිපළ හිමියන්ගේ රැකියා අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති බැවින්, මෙම අති අමානුෂීය ක්‍රමය නවත්වාලීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වාර්ෂිකව කිරි පිටි ආනයනය සඳහා විශාල මුදලක් වැයවන අතර එම මුදල් අප රට තුළම ඉතිරි කරගත හැකිනම්, එය රටේ ආර්ථිකයට විශාල පිටුබලයක් වන බැවින්, කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ඉතා ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන රැසක් සහිත දිස්ත්‍රික්කයක් වන අතර අතීතයේදී කුරුණෑගල, දඹදෙණිය සහ යාපහුව වැනි රාජධානි පිහිටා තිබුනේද කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වුවත්, අද වනවිට එම පෞරාණික ස්ථානවල ආරක්ෂාව සම්බන්ධයෙන් බලවත් ගැටලු මතුවී ඇති බැවින්, එම පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම,— ඕනෑම රටක සාර්ථක සමාජ ආරක්ෂණ ජාලයක් පැවතීම එම රටේ ජීවත් වන පුරවැසියන්ට වැදගත් වන අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථ සාධක ක්‍රමයක් ක්‍රියාත්මක වුවද, රටේ අවිධිමත් අංශයේ සේවකයන් සඳහා කිසිදු සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක නොවන බැවින්, සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ වකුගඩු රෝගීන් සඳහා රෝහලක් ස්ථාපිත කිරීම,— වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ මෑත කාලීනව විශාල ලෙස වකුගඩු රෝගය පැතිරීම ඉහළ ගොස් ඇති බැවින්, එම රෝගීන් වෙනුවෙන් වයඹ පළාත තුළ රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තැලසීමියා රෝගීන් සඳහා රෝහලක් ස්ථාපිත කිරීම,— මෑතකාලීනව ශ්‍රී ලංකාවේ වැඩිම තැලසීමියා රෝගීන් වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන අතර, තවමත් එම රෝගීන්ට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වෙනම රෝහලක් ස්ථාපිත කර නොමැති බැවින්, එම රෝගීන් සඳහා වෙනම රෝහලක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ ගරා වැටෙමින් තිබෙන විහාරස්ථාන සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ වැඩිම විහාරස්ථාන සංඛ්‍යාවක් පිහිටා ඇති, ස්වාමීන්වහන්සේලා වැඩිම ප්‍රමාණයක් වැඩ සිටින, බෞද්ධයන් වැඩිම පිරිසක් වාසය කරන හා ශාසනාරක්ෂක බල මණ්ඩල වැඩිම සංඛ්‍යාවක් ක්‍රියාත්මකව පවතින වයඹ පළාතෙහි ගරා වැටෙමින් තිබෙන විහාරස්ථාන සංවර්ධනය කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 37/'19

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වූ පවුල් සඳහා සහන සලසාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භූගත උමං මාර්ග කැණීම හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ ජනතාවට සිය නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වී මේ වනවිට වසර තුනක කාලයක් ගතවී තිබුණ ද, අවතැන් වූ එම ජනතාවට මෙතෙක් කිසිදු වන්දි මුදලක් හෝ සහනයක් ලැබී නොමැති බැවින්, එම ජනතාවට සහන සලසා දීමේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 38/'19

ගරු හේෂා විතානගේ මහතා,— දුම්රිය මඟින් එළවළු ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම,— බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු එළවළු නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කවල සිට එළවළු ගොවීන්ගේ නිෂ්පාදන අඩු පිරිවැයකින්, අපතේ යෑම අවම කරමින් දුම්රිය මඟින් රටේ සෙසු ප්‍රදේශවල වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/'19

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජල හිඟයකට මුහුණ දී සිටින ජනතාවට ජල පහසුකම් ලබාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07ක පවුල් 8394ක ජනතාවට උග්‍ර ජල හිඟයකට මුහුණ පෑමට සිදුවී ඇති බැවින්, එම ජනතාවට අවශ්‍ය ජල පහසුකම් ලබාදීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/'19

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම,— අයහපත් කාලගුණය සහිත කාලසීමාවන්වලදී නිරන්තරයෙන්ම ගංවතුරින් ආපදාවට ලක්වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමට වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'19

ගරු හේෂා විතානගේ මහතා,— අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කිරීම,— කලාව, ක්‍රීඩාව ආදී බොහෝ අංශවල සබරගමුවට උරුම ආවේණික ලක්ෂණ ඇති අතර අද වනවිට වාණිජකරණය හමුවේ එම ආවේණික ලක්ෂණ අභාවයට යාමේ අවදානමක් ඇති බැවින්, අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/'19

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා අවම කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නිකුත් කරන ලද වාර්තාවන්ට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා තත්ත්වයන්ට ලක්වීමේ අවදානමක් සහිත ස්ථාන රාශියක් ඇති බව පෙන්වා දී ඇති බැවින්, එම තත්ත්වයන් අවම කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/'19

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— අන්තර්ජාලය තුළ අසභ්‍ය වීඩියෝ පට සංසරණය වීම වැළැක්වීමෙහිලා විශේෂ ඒකකයක් පිහිටුවීම,— වර්තමානයේ බහුල වශයෙන් අන්තර්ජාලය ඔස්සේ නොයෙකුත් අසභ්‍ය වීඩියෝ දර්ශන සංසරණය වීම මඟින් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය විනාශවන අතර විශේෂයෙන්ම, කාන්තා පාර්ශ්වය එමඟින් විශාල අපහසුතාවයකට පත්වන බැවින්, මෙවන් වීඩියෝ දර්ශන ළඟ තබාගෙන සිටින, බෙදා හරින හා නිර්මාණය කරන පුද්ගලයන් පිළිබඳව විමර්ශනය කිරීමට ප්‍රතිඵලදායී විශේෂ ඒකකයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'19

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— විශ්වවිද්‍යාල හා අනෙකුත් සියලුම උසස් අධ්‍යාපන ආයතනවලට විශේෂ පුහුණුවලත් මානසික උපදේශකවරු හෝ අනුශාසකවරු පත්කිරීම,— වර්තමානයේ බහුල වශයෙන් දක්නට ලැබෙන තරුණ තරුණියන්, සිසු සිසුවියන් සියදිවි හානිකර ගැනීමේ ප්‍රවණතාවය මැඩපැවැත්වීම සඳහා සියලුම රජයේ අධ්‍යාපන ආයතන සඳහා පුහුණුවලත් මානසික උපදේශකවරු, අනුශාසකවරු හෝ එම අධ්‍යාපන ආයතනවල දැනට සිටින ගුරුවර ගුරුවරියන්ට මානසික උපදේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මොරටුව විශ්වවිද්‍යාලය සඳහා යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කිරීම,— 2018 අයවැය මඟින් මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය පීඨයක් ඉදිකිරීමට යෝජනා කර ඇති අතර එම යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 46/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ඨ සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්දනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම උදෙසා සියලුම දරුවන්ට, 9 ශ්‍රේණිය දක්වා ඔවුන්ගේ ආගමට අනුකූල දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 47/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— කොළොන්නාව මහ නගර සභාව ස්ථාපිත කිරීම,— කොළඹ නගරය සහ එහි තදාසන්න නගර පරිපාලනය සඳහා කොළඹ, කඩුවෙල සහ කෝට්ටේ යනුවෙන් මහ නගර සභා තුනක් පැවතිය ද, මෙම මහ නගර සභා බල ප්‍රදේශ තුනටම මායිම්ව ඇති කොළොන්නාව මැතිවරණ කොට්ඨාසය පාලනය වන්නේ ප්‍රාදේශීය පරිපාලන ඒකක දෙකක් වන කොළොන්නාව නගර සභාව සහ කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව යටතේ වන බැවින්, සමස්ත කොළොන්නාව මැතිවරණ කොට්ඨාසයේම ආර්ථික, සමාජයීය හා සංස්කෘතික විෂමතාවන් ඇති කිරීමට මෙය හේතු වී ඇති අතර, අවට පවතින මහ නගර සභා, පරිපාලනයේ කාර්යක්ෂමතාව මත ශීඝ්‍ර සංවර්ධනයක් මේ වනවිට ළඟා කර ගෙන ඇති බැවින්, සමස්ත කොළොන්නාව මැතිවරණ කොට්ඨාසයේම සංවර්ධනය අරමුණු කර ගනිමින් කොළොන්නාව නගර සභාව සහ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව එකාබද්ධ කර කොළොන්නාව මහ නගර සභාව ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.